තඹලගමුව ප්‍රාදේශීය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 පෙබරවාරි 17 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අප්‍රේල් 01 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(අ) දැයට කිරුළ සංවර්ධන සැලසුම් වැඩසටහන යටතේ සභාව විසින් 2013 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු ලී බඩු සහ සවිකිරීම් වල වටිනාකම වූ රු.645,435 ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.17,615 ක් වූ විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 44,170,444 | ඉඩම් සහ ගොඩනැගිලි ලේඛණය |
| යන්ත්‍ර සූත්‍ර | 1,564,960 | ස්ථාවර වත්කම් ලේඛණය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 6,878,050 | |
| ආදායම් තැන්පතු | 1,140,523 | විස්තරාත්මක උපලේඛණ සහ කාල විශ්ලේෂණ |
| ටෙන්ඩර් තැන්පතු | 366,081 | |
| විවිධ තැන්පතු | 303,862 | |
| වෙනත් තැන්පතු | 2,710,125 | |

1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| II පරිච්ඡේදයේ 158 වගන්තිය | - | සභා සීමාව තුල තක්සේරු බදු අයකිරීම සඳහා ලේකම්වරයා විසින් සිය අත්සන සහිත අධිකාරය පැවරීමේ දැන්වීමක් නිකුත් කර නොතිබුණි. |

(ආ) නැගෙනහිර පළාත් සභා මුදල් රෙගුලාසි
-----------------------------------

රීති අංක 236(3) - සභාව විසින් ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස වෙනුවෙන් බැංකු ගිණුම් දෙකකට අදාළ බැංකු සැසඳුම් වාර්තා පිළියෙල කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
---------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.17,436,411 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.21,231,631 ක් විය. එබැවින් පසුගිය වර්ෂයට වඩා මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,795,220 ක වර්ධනයක් දක්නට ලැබිණි.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
------------------------------------------------

ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳව සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| i. | වරිපනම් සහ බදු | 6,358 | 3,531 | 3,027 |
| ii. | කුලී | - | - | - |
| iii. | සේවා ගාස්තු | 8,220 | 5,601 | 2,619 |
| iv. | වෙනත් ආදායම් | 15,035 | 1,263 | 13,772 |

2.3 උසාවි දඩ

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2)(අ) වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2013 දෙසැම්බර් 31 වනවිට සභාවට ලැබිය යුතු උසාවි දඩ නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 මුද්දර ගාස්තු

-----------------

සභාව විසින් 2013 දෙසැම්බර් 31 දිනට ගණනය කරන ලද ප්‍රතිපූර්ණ අයදුම්පත් පෝරමය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 178 සහ 179 වගන්ති ප්‍රකාරව ණය ලබාගැනීම සඳහා සභාව විසින් පළාත් පාලන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. නමුත් සභාව විසින් පූර්ව අනුමැතිය ලබා නොගෙන රු.320,000 ක ණයක් ලබාගෙන ටිපර් රථයක් මිළදී ගෙන තිබුණි.

(ආ) 2013 ජුනි සිට දෙසැම්බර් දක්වා සාමාජිකයන්ට ලබාදුන් පුස්තකාල පොත් 87 ක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුනි.

4. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක | 01 | - | 01 | - |
| සහායක | 18 | 09 | 09 | - |
| සුළු සේවක | 27 | 12 | 15 | - |
| වෙනත් | - | 33 | - | 33 |

කළමනාකරණ සහකාර සහ ආදායම් නිලධාරී තනතුරු වල පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. මෙම තනතුරු වර්ෂ 08 කට අධික කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතුණි.

5. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) තොග පාලනය
(ඈ) අත්තිකාරම් අයකිරීම
(ඉ) ආදායම් එකතු කිරීම
(ඊ) ප්‍රසම්පාදන පරිපාටිය
(උ) ණය පාලනය